අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026

| කෘෂි විද්‍යාව I | 08 S I | පැය දෙකයි |
|---|---|---|

**උපදෙස් :**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) හා (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. වියළි කලාපයේ රටකජු වගාවක් සඳහා වඩාත් උචිත ජල සම්පාදන ක්‍රමය වන්නේ,
   (1) බේසම් ජල සම්පාදන ක්‍රමය ය.
   (2) වළලු ජල සම්පාදන ක්‍රමය ය.
   (3) බඳුන් ජල සම්පාදන ක්‍රමය ය.
   (4) ඇළි හා වැටි ජල සම්පාදන ක්‍රමය ය.
   (5) පිටාර ජල සම්පාදන ක්‍රමය ය.

2. ආහාරයක ජල සක්‍රියතාව,
   (1) මගින් රසායනික සංයෝග සමඟ තදින් බැඳී ඇති ජල ප්‍රමාණය නිරූපණය වේ.
   (2) වැඩි විට ආහාරයේ ඇති නිදහස් ජල ප්‍රමාණය අඩු වේ.
   (3) අවම මට්ටමක පවත්වා ගැනීමෙන් ආහාර නරක් වීම අඩු කළ හැකි ය.
   (4) වැඩි කිරීමට ආහාරය අධි ශීත පරිසරයක ගබඩා කළ යුතුය.
   (5) අඩු විට ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය ඉහළ ගොස් ආහාර නරක් වීම ඉක්මන් වේ.

3. බැක්ටීරියා මගින් ඇති කරනු ලබන පාංශු ජනන රෝගයක් වනුයේ,
   (1) වම්බටු හිටු මැරීමේ රෝගය ය.
   (2) තේ බිබිලි රෝගය ය.
   (3) පැපොල් මුදු පුල්ලි රෝගය ය.
   (4) කෝපි මලකඩ රෝගය ය.
   (5) තක්කාලි පත්‍ර විචිත්‍ර රෝගය ය.

4. පාංශු දෘශ්‍ය ඝනත්වය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) පසට කාබනික ද්‍රව්‍ය එකතුවීම නිසා පසෙහි දෘශ්‍ය ඝනත්වය වැඩි වේ.
   (2) පසේ වයනය අනුව දෘශ්‍ය ඝනත්වය වෙනස් නොවේ.
   (3) පසේ සච්ඡිද්‍රතාවය වැඩි වන විට දෘශ්‍ය ඝනත්වය අඩු වේ.
   (4) සුසංහනය වූ පසක දෘශ්‍ය ඝනත්වය අඩු වේ.
   (5) දෘශ්‍ය ඝනත්වය වැඩි පසක ජල අවශෝෂණ ධාරිතාව වැඩි වේ.

5. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සම්මත වීමෙන් පසු,
   (1) ගොවි කාරක සභා ක්‍රමය අහෝසි කර වගා නිලධාරී ක්‍රමය ආරම්භ විය.
   (2) ගොවි ජන සේවා කාරක සභා සහ ගොවි ජන සේවා මධ්‍යස්ථාන අළුතින් ආරම්භ කෙරුණි.
   (3) අඳ ගොවීන් අලුතින් නම් කිරීම හා ලියාපදිංචි කිරීම සිදු විය.
   (4) කුඹුරු ඉඩම් අනවසරයෙන් වෙනත් කාර්ය සඳහා භාවිත කිරීම වැළැක්වීමට පියවර ගැනුණි.
   (5) ගොවි සංවිධාන විශාල සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට පියවර ගැනුණි.


6. බෝග වගාවේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවිය හැකි ක්‍රියාමාර්ගයක් වනුයේ,
   (1) ජල සම්පාදනය සමඟ පොහොර යෙදීම ය.
   (2) නිර්දේශිත පොහොර කිහිපවරකට ක්ෂේත්‍රයට යෙදීම ය.
   (3) පත්‍ර මතට ඉස්නාවක් ලෙස රසායනික පොහොර යෙදීම ය.
   (4) පස ජලයෙන් සංතෘප්ත කර පසට පොහොර යෙදීම ය.
   (5) පසට ශීඝ්‍රයෙන් පෝෂක මුදාහරින පොහොර යෙදීම ය.

[දෙවැනි පිටුව බලන්න]

7. කොත්මලේ ප්‍රදේශයේ හෙක්ටයාර 2 ක භූමි ප්‍රමාණයකට පැයට මිලිමීටර් 20 ක වර්ෂාපතනයක් ලැබුණේ නම් එම ප්‍රදේශයට පැය 2ක් තුළ දී ලැබුණු වර්ෂාපතන ප්‍රමාණය වනුයේ,
   (1) 100 $m^3$ කි. (2) 200 $m^3$ කි. (3) 400 $m^3$ කි.
   (4) 800 $m^3$ කි. (5) 1000 $m^3$ කි.

8. පෝෂක ඌනතාවක් නිසා අර්තාපල් වගාවක පත්‍ර දාර කහ පැහැ වී අවසානයේ පිළිස්සුණු ස්වභාවයක් පෙන්නුම් කරයි. එම ඌනතාව මග හැරීම සඳහා වගාවට යෙදිය යුතු රසායනික පොහොර වර්ගය වනුයේ,
   (1) මියුරේට් ඔෆ් පොටෑෂ් ය.
   (2) ත්‍රිත්ව සුපර් පොස්පේට් ය.
   (3) සෝඩියම් හයිඩ්‍රේට් ය.
   (4) සල්ෆේට් ඔෆ් පොටෑෂ් ය.
   (5) මැග්නීසියම් සල්ෆේට් ය.

• මුලෙහි අරීය ජල පරිවහනයට අදාළ රූපසටහනක් පහත දැක් වේ. ප්‍රශ්න අංක 9 ට පිළිතුර සැපයීම සඳහා මෙම රූපසටහන භාවිත කරන්න.




9. මෙහි මූලකේශයේ සිට සෛලම වාහිනිය තෙක් ජලය ගමන් කිරීමේ මාර්ගය වන P, Q, R සහ S යන කොටස් පිළිවෙලින්,
   (1) බාහිකය, අන්තශ්චර්මය, පරිචක්‍රය සහ අපිචර්මය ය.
   (2) අපිචර්මය, බාහිකය, පරිචක්‍රය සහ අන්තශ්චර්මය ය.
   (3) බාහිකය, පරිචක්‍රය, අන්තශ්චර්මය සහ අපිචර්මය ය.
   (4) පරිචක්‍රය, අපිචර්මය, බාහිකය සහ අන්තශ්චර්මය ය.
   (5) අපිචර්මය, බාහිකය, අන්තශ්චර්මය සහ පරිචක්‍රය ය.


10. ශිෂ්‍යයෙකු පාංශු වයනය සෙවීමේ පරීක්ෂණයක දී පාංශු කාබනික ද්‍රව්‍ය ඉවත් කළ පස් නියැදියක වැලි ප්‍රතිශතය 20% ක් හා රොන්මඩ ප්‍රතිශතය 10% ක් ලෙස අනාවරණය කර ගන්නා ලදී. මෙම පසෙහි,
   (1) ජල වහනය දියුණු වන අතර පාංශු වාතනය වැඩි ය.
   (2) පාංශු වාතනය සහ කැටායන හුවමාරු ධාරිතාව වැඩි ය.
   (3) පාංශු වාතනය අඩු වන අතර ජල අවශෝෂණ ධාරිතාව වැඩි ය.
   (4) සච්ඡිද්‍රතාව වැඩි වන අතර ජල අවශෝෂණ ධාරිතාව අඩු ය.
   (5) සච්ඡිද්‍රතාව වැඩි වන අතර කැටායන හුවමාරු ධාරිතාව අඩු ය.

11. බිම් සැකසීමේ උපකරණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) සැහැල්ලු යකඩ නගුල සහ ජපන් පරිවර්ත්‍ය නගුල, සත්ත්ව බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ වේ.
   (2) කොකු නගුල සහ රොටවේටරය, යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ වේ.
   (3) තැටි නගුල සහ තැටි පෝරුව, යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන ද්විතියික බිම් සැකසීමේ උපකරණ වේ.
   (4) රිජරය සහ ජපන් රොටරි වීඩරය, යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන අතුරුයත් ගෑමේ උපකරණ වේ.
   (5) කොකු නගුල හා ඇණදත් පෝරුව, යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන ද්විතියික බිම් සැකසීමේ උපකරණ වේ.

12. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන බීජ නිෂ්පාදන වැඩ පිළිවෙළ යටතේ අත්තිවාරම් බීජ නිෂ්පාදනය කරනු ලබන්නේ,
   (1) අභිජනන මධ්‍යස්ථානවල දී ය.
   (2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළවල දී ය.
   (3) ලියාපදිංචි පෞද්ගලික ගොවිපොළවල දී ය.
   (4) රජයේ ගොවිපොළ හා ලියාපදිංචි පෞද්ගලික ගොවිපොළවල දී ය.
   (5) පෞද්ගලික ගොවිපොළ හා ලියාපදිංචි කොන්ත්‍රාත් ගොවිපොළවල දී ය.

13. විදුලි බලයෙන් ක්‍රියාකරන කේන්ද්‍රාපසාරී පොම්පයක් ක්‍රියාත්මක කළ විට ඉම්පෙලරය භ්‍රමණය වුව ද, ජලය නළය දිගේ ඉහළට ඇදී නොඑන බව නිරීක්ෂණය විය. මෙයට හේතුව විය හැක්කේ,
   (1) පොම්පයේ බෙයාරින් හෝ බුෂ් ගෙවී තිබීම ය.
   (2) පා කපාටයෙන් ජලය කාන්දු වීම ය.
   (3) පා කපාටය ජල ප්‍රභවයේ පතුලේ ස්පර්ශ වීම ය.
   (4) කන්ඩෙන්සරය පුපුරා තිබීම ය.
   (5) ඉන්ධන නළ මාර්ගයේ වාතය රැඳී තිබීම ය.

• පසේ පවතින ජල ආකාර හා ඒවාට අදාළ pF අගය පහත රූපසටහනෙන් දැක් වේ. ප්‍රශ්න අංක 14 ට පිළිතුරු සැපයීමට එම රූපසටහන භාවිත කරන්න.




14. ඉහත රූප සටහනේ දැක්වෙන A, B, C හා D ජල ආකාර අතුරෙන් ශාකයට ලබාගත හැකි සහ ලබාගත නොහැකි ජල ආකාරය/ආකාර වන්නේ පිළිවෙලින්,
   (1) A, B සහ C ය.
   (2) C සහ A, B ය.
   (3) C සහ A, D ය.
   (4) B, C සහ A ය.
   (5) B සහ C, D ය.


15. වායව අතු බැඳීම මගින් ශාක ප්‍රචාරණයේ දී,
   (1) සෙලම පටකය තෙක් පොතු වලයක් කපා ඉවත් කරයි.
   (2) පොතු වලය ඉවත් කළ ස්ථානයේ පහළ කෙළවරේ මුල් හට ගැනීම ආරම්භ වේ.
   (3) මුල් ඇද්දවීම උත්තේජනය කිරීම සඳහා පොතුවලය ඉවත් කළ ස්ථානයේ ගිබරලික් අම්ලය ආලේප කරයි.
   (4) කැපුම අසළ ආහාර සංචිත වීමෙන් C:N අනුපාතය ඉහළ ගොස් මුල් ඇදීම උත්තේජනය වේ.
   (5) අහිතකර කාලගුණික තත්ත්වවල බලපෑමෙන් තොරව නව පැළ ලබාගත හැකිය.


16. සිටුවීමට සුදුසු බීජ නියැදියක් තෝරා ගැනීම සඳහා ශිෂ්‍යයෙකු විසින් සිදු කළ පරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
   A - බීජ සාම්පලයකට ප්‍රරෝහණයට අවශ්‍ය තත්ත්ව ලබා දී ප්‍රරෝහණ ප්‍රතිශතය නිරීක්ෂණය කිරීම
   B - බීජ සාම්පලයක් තෙත් පරිසරයක තබා කාබන්ඩයොක්සයිඩ් පිටවීම නිරීක්ෂණය කිරීම
   C - ජලයේ පෙඟවූ බීජ සාම්පලයකට ටෙට්‍රසෝලියම් ක්ලෝරයිඩ් යොදා බීජ පත්‍රවල වර්ණය නිරීක්ෂණය කිරීම
   D - බීජ සාම්පලය විජලකාරකයක් සමග සංවෘත කුටීරයක තබා ස්කන්ධය මැනීම


ඉහත පරීක්ෂණ අතුරෙන් සුප්ත බීජවල ජීව්‍යතාව නිර්ණය කිරීම සඳහා සිදු කළ හැකි පරීක්ෂාව/පරීක්ෂා වනුයේ,
   (1) A පමණි.
   (2) A සහ C පමණි.
   (3) B සහ C පමණි.
   (4) A සහ D පමණි.
   (5) B සහ D පමණි.

17. තවාන් ජීවානුහරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) තවාන් පිළිස්සීමේ දී සුළං හමන දිශාවට විරුද්ධව පහළින්ම ඇති පිදුරු තට්ටුවට ගිනි තැබීම සිදු කරයි.
   (2) තවානට දිලීර නාශක යෙදීමේ දී තවාන වියළිව ඇති විට දිලීර නාශක තවාන පුරා සමාකාරව විසිරෙන ලෙස යොදනු ලබයි.
   (3) සූර්ය තාපය මගින් ජීවානුහරණයේ දී තවාන තෙත් කර කළු පොලිතීන් වලින් ආවරණය කරයි.
   (4) ධූමකරණය මගින් ජීවානුහරණයේ දී මෙතිල් බ්‍රෝමයිඩ්, කැප්ටාන් හා තිරාම් යන රසායනික ද්‍රව්‍ය භාවිත කරයි.
   (5) උණු ජලය මගින් ජීවානුහරණයේ දී $85^{0}C$ උෂ්ණත්වයේ පවතින ජලය තවාන පුරා ඒකාකාරීව යොදනු ලබයි.

18. පරිසරයේ ආර්ද්‍රතාවය හා ශාකයක උත්ස්වේදන ශීඝ්‍රතාවය අතර සම්බන්ධතාව වඩාත් නිවැරදිව පැහැදිලි කරනු ලබන ප්‍රස්තාරය වනුයේ,


(1)



(2)



(3)



(4)



(5)



19. ශාක පෝෂක පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පොස්පරස්, ශාකයේ විභාජක පටකවල වර්ධනයට හා සෛල බිත්ති සෑදීමට වැදගත් වන අතර අචල පෝෂකයකි.

B - පොටෑසියම්, ශාකවල පූටිකා විවෘත වීම හා වැසීමට බලපාන අතර එය පසෙන් අවශෝෂණය කර ගන්නා මූලද්‍රව්‍යයකි.

C - මැග්නීසියම්, ශාකයේ පරිවෘත්තීය ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ වන අතර එය රහිතව ශාකයට ජීවන චක්‍රය සම්පූර්ණ කළ නොහැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) B පමණි.
(3) C පමණි. (4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ලම ය.

- පස් සාම්පලයක් විශ්ලේෂණයෙන් ලබාගත් ආම්ලික හා භාස්මික කැටායන ප්‍රමාණ පිළිබඳ දත්ත පහත දැක්වේ.

$Ca^{+2}$ - 4 meq/100g soil    $H^{+}$ - 1 meq/100g soil
$K^{+}$ - 2 meq/100g soil    $Al^{+3}$ - 2 meq/100g soil
$Mg^{+2}$ - 2 meq/100g soil    $Na^{+}$ - 1 meq/100g soil

20. මෙම පසෙහි භස්ම සංතෘප්ත ප්‍රතිශතය වනුයේ,

(1) 75% කි. (2) 25% කි. (3) 33% කි.
(4) 85% කි. (5) 43% කි.

21. මධ්‍යම විෂ සහිත කෘමිනාශක ඇසුරුමක ලේබලයේ විෂ මට්ටම පෙන්වන වර්ණ තීරුව,

(1) නිල් පැහැතිය. (2) රතු පැහැතිය.
(3) කහ පැහැතිය. (4) සුදු පැහැතිය.
(5) කොළ පැහැතිය.

22. අනුරාධපුර ප්‍රදේශයේ වගා කරන ලද බඩ ඉරිඟු වගාවක ජල සම්පාදන අවස්ථාවේ දී පසේ තෙතමන ප්‍රතිශතය 15% කි. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ දී පසේ තෙතමන ප්‍රතිශතය 40% ක් හා පසේ දෘශ්‍ය ඝනත්වය 1.6gcm$^{-3}$ කි. ශාකයේ මූල මණ්ඩලයේ ගැඹුර 30cm ක් නම් ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව වනුයේ,

(1) 10cm කි. (2) 12cm කි. (3) 14cm කි.
(4) 16cm කි. (5) 18cm කි.

23. බීජෞෂණය ආරම්භ කළ සංසේචිත කිකිළි බිත්තරයකින් පැටවකු බිහි කිරීමට ගතවන කාලය වනුයේ,

(1) දින 07 කි. (2) දින 14 කි. (3) දින 18 කි.
(4) දින 21 කි. (5) දින 28 කි.

24. ආහාර ලේබලයක අඩංගු මූලික තොරතුරු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත සඳහන් වේ.

A - පොදු නාමය ඕනෑම භාෂා තුනකින් පැහැදිලිව හා ප්‍රකටව පෙනෙන පරිදි තද අකුරින් මුද්‍රණය කළ යුතුය.

B - ආහාරයේ ශුද්ධ අන්තර්ගතය ජාත්‍යන්තර සංකේත ඇසුරෙන් දැක්විය යුතුය.

C - කල් ඉකුත් වීමේ දිනය භාෂා තුන අතුරෙන් ඕනෑම භාෂා දෙකක් භාවිත කර සඳහන් කළ යුතුය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.

(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

25. සමෝධානිත පළිබෝධ කළමනාකරණය යනු,

(1) කෘමි පළිබෝධ පාලනය කිරීමට ජෛව විද්‍යාත්මක ක්‍රම බහුලව භාවිත කරන පළිබෝධ පාලන ක්‍රමයකි.

(2) රසායනික පළිබෝධනාශක භාවිත නොකරන පරිසර හිතකාමී පළිබෝධ පාලන ක්‍රමයකි.

(3) වගා ක්ෂේත්‍රයේ සිටින සියලු ජීවීන් විනාශ කරන සාර්ථක පළිබෝධ පාලන ක්‍රමයකි.

(4) පළිබෝධ පාලන ක්‍රම කිහිපයක් සුදුසු ලෙස යොදා ගනිමින් සිදුකරන පළිබෝධ පාලන ක්‍රමයකි.

(5) පළිබෝධ ගහන ඝනත්වය ආර්ථික දේහලීය මට්ටමට වඩා පහළින් පවත්වා ගැනීමේ අරමුණින් සිදු කරන පළිබෝධ පාලන ක්‍රමයකි.

26. ලිබිග්ගේ අවමතා නියමය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - යම් මූලද්‍රව්‍යයක ඌනතාවයක් ඇතත්, අනෙකුත් සියලුම පෝෂක ප්‍රමාණවත් අයුරින් ඇත්නම් බෝගය ප්‍රශස්තව වර්ධනය වේ.

B - ශාකයට ඌනව ඇති මූලද්‍රව්‍යය සැපයුව ද බෝග වර්ධනයේ වෙනසක් දක්නට නොලැබේ.


C - ඌනව ඇති මූලද්‍රව්‍යය ලබාදීමේ දී වෙනත් මූලද්‍රව්‍යයක ප්‍රමාණය අඩුවිය හැකි අතර එය බෝග වර්ධනයේ සීමාකාරී පෝෂකය බවට පත්වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ B පමණි. (5) A, B සහ C යන සියල්ලම ය.

- ප්‍රශ්න අංක 27 ට පිළිතුරු සැපයීම සඳහා පහත දක්වා ඇති රූපසටහන යොදා ගන්න.



27. ඉහත රූපසටහනේ දක්වා ඇති ඇටවුම භාවිත කරනුයේ,

(1) ශාක පරපෝෂී නෙමටෝඩාවන් හඳුනා ගැනීමට ය.

(2) ව්‍යාධිජනක බැක්ටීරියා හඳුනා ගැනීමට ය.

(3) වී වගාවේදී කොළපාළු රෝගය ඇති කරන *Pyricularia oryzae* දිලීරය හඳුනා ගැනීමට ය.

(4) පසේ ඇති පළිබෝධකයින්ගේ කෝෂ අවස්ථා නිරීක්ෂණයට ය.

(5) ව්‍යාධිජනක දිලීර ගුණනය කිරීමට ය.

28. සංසේචනයට පෙර හා පසු පුෂ්පයක කොටස් වල සිදුවන පරිවර්තනීය වෙනස්කම් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A - පුං ජන්මාණුව හා ජායා ජන්මාණුව යුක්තාණුව බවට පත්වෙයි.

B - ඩිම්බාවරණය ඵලාවරණය බවට පත්වෙයි.

C - ඩිම්බකෝෂ බිත්තිය බීජාවරණය බවට පත්වෙයි.

D - පුං ජන්මාණුව හා ද්විතියික න්‍යෂ්ටිය එකතු වීමෙන් භ්‍රෑණපෝෂ න්‍යෂ්ටිය සෑදෙයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ ,

(1) A පමණි. (2) A සහ B පමණි. (3) B සහ C පමණි.

(4) A සහ C පමණි. (5) A සහ D පමණි

29. ප්‍රවේණි විද්‍යාව පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
    A - යම් ලක්ෂණයක් පාලනය කරන ජානයක් එක් සමජාත වර්ණදේහයක පිහිටන විට ඊට අනුරූපව අනෙක් සමජාත වර්ණදේහයේ ද ජානයක් පිහිටයි.
    B - ඇලිලික ජාන මගින් F1 පරම්පරාවේ විෂමයෝගී අවස්ථාවේ දී ඉස්මතු වන ඇලීලය ප්‍රමුඛ ඇලීලය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B යන යන දෙකම සත්‍ය වේ.
(4) Aහා B සත්‍ය වන අතර B මගින් A පැහැදිලි කරයි.
(5) A හා B සත්‍ය වන අතර A මගින් B පැහැදිලි කරයි.

30. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී දැල් ගෘහ භාවිත කිරීමේ මූලික අරමුණ වනුයේ,
(1) ගෘහය තුළ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය වැඩි කිරීම ය.
(2) ගෘහය තුළට ආලෝකය ඇතුළු වීම පාලනය කිරීම ය.
(3) මීයන්, සාවුන් වැනි පළිබෝධකයන්ගෙන් වගාව ආරක්ෂා කිරීම ය.
(4) ගෘහය තුළ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව අඩු කිරීම ය.
(5) ගෘහය තුළට දිලීර, බැක්ටීරියා වැනි රෝගකාරක ඇතුල්වීම අවම කිරීම ය.

31. වගා බිමක පහත ලක්ෂණ සහිත කෘමියෙකු නිරීක්ෂණය කරන ලදී.
- ඉතාම කුඩා මෘදු දේහයක් ඇත.
- පියාපත් ඉතා පටු වන අතර පියාපතේ දාරයේ සිහින් දිගැටි කෙඳි ඇත.
- උදරය කෙළවර කේතුවක හැඩය ගනී.

මෙම කෘමියා අයත් වන ගෝත්‍රය විය හැක්කේ,
(1) ඕතොප්ටෙරා ය.
(2) හෙමිප්ටෙරා ය.
(3) තයිසනොප්ටෙරා ය.
(4) කෝලියොප්ටෙරා ය.
(5) අයිසොප්ටෙරා ය.


32. ප්‍රවේණික විචලතාව ඇති කිරීම සඳහා යොදා ගන්නා අභිජනන ක්‍රමයක් පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.
- දිරියෙන් වැඩි පළිබෝධ ප්‍රතිරෝධී ශාක ලබා ගැනීමට හැකි වීම
- විශාල හා ගුණාත්මක ඵල නිපදවීම
- ආර්ථික වටිනාකමක් සහිත බීජ රහිත ඵල නිපදවීමට භාවිත කිරීම

ඉහත ලක්ෂණ දරණ ශාක අභිජනන ක්‍රමය විය හැක්කේ,
(1) විකෘති මගින් ත්‍රිගුණ ශාක ඇති කිරීම ය.
(2) සහාභිජනනය ය.
(3) විකෘති මගින් චතුර්ගුණ ශාක ඇති කිරීම ය.
(4) නුමුහුම් පෙළ වරණය ය.
(5) සමූහ පෙළ වරණය ය.

33. පෝෂක ද්‍රාවණ තුළ බෝග වගාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A - 0.5mm ක පමණ ද්‍රව පටලයක් ලෙස පෝෂක ද්‍රාවණය ඇළිය තුළින් ගලා යාමට සලස්වයි.
    B - කෘත්‍රිම වායු ධාරා මගින් පෝෂක ද්‍රාවණය වාතනය වීමට සලස්වයි.
    C - රාබු, කැරට් හා බීට් වැනි බෝග වගා සඳහා බහුලව භාවිත කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නොගැඹුරු පෝෂක ද්‍රාවණ පටල තාක්ෂණය (NFT) පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) A, B සහ C යන සියල්ලම ය.

- අස්වනු නෙළීමෙන් පසු කාලය හා ශ්වසන වේගය අතර ප්‍රස්තාරය පහත දැක්වේ. ප්‍රශ්න අංක 34 ට පිළිතුරු සැපයීම සඳහා එම රූප සටහන යොදා ගන්න.




34. ඉහත A සහ B කාණ්ඩවලට ගැළපෙන බෝග සඳහා උදාහරණ වනුයේ,
    (1) A - පෙයාර්ස් සහ ඇපල් B - පැපොල් සහ කෙසෙල් ය.
    (2) A - පෙයාර්ස් සහ කෙසෙල් B - ස්ට්‍රෝබෙරි සහ ඇපල් ය.
    (3) A - දෙහි සහ ඇපල් B - අන්නාසි සහ මිදි ය.
    (4) A - මිදි සහ අන්නාසි B - කෙසෙල් සහ අඹ ය.
    (5) A - පේර සහ පෙයාර්ස් B - මිදි සහ දෙහි ය.

35. මානව පෝෂණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A - ස්ත්‍රී පුරුෂ බව සහ වයස ආදි සාධක මත පුද්ගල දෛනික කැලරි අවශ්‍යතාව වෙනස් වේ.
    B - ජල ද්‍රාවී තන්තු අන්ත්‍රයේ දී ජලය උරා ගැනීමෙන් මලවල ප්‍රමාණය වැඩි කරයි.
    C - ආහාරවල ඇති යකඩ අවශෝෂණය දුර්වල වීම මගින් රක්තහීනතාව ඇති වේ.

    ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
    (1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
    (4) A සහ C පමණි. (5) B සහ C පමණි.

36. කෘෂිකර්මාන්තය ආශ්‍රිත සෞඛ්‍ය ගැටලු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A - නොපිසූ මස් හා පැස්ටරීකරණය නොකළ කිරි මගින් බෲසෙල්ලෝසිස් රෝගය වැළඳිය හැකිය.
    B - *Mycobacterium bovis* යනු බෲසෙල්ලෝසිස් රෝගය ඇති කරන රෝගකාරකයා වේ.
    C - මීයන්ගේ මුත්‍ර මිශ්‍ර වූ ජලය සමේ ඇති තුවාල මත තැවරී මිනිස් ශරීරයට ඇතුළු වීමෙන් ලෙප්ටොස්පයිරෝසිස් (Leptospirosis) රෝගය ආසාදනය වේ.

    ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
    (1) A පමණි. (2) B පමණි. (3) A සහ C පමණි.
    (4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම ය.

37. වාණිජ මට්ටමින් සිදුකරන බ්‍රොයිලර් පාලනයේ දී,
    (1) ආහාර පරිවර්තන අනුපාතය දෙකට වඩා වැඩි වීම ලාභදායක වේ.
    (2) බ්‍රොයිලර් ආරම්භක සලාකයට සාපේක්ෂව අවසාන සලාකයේ තිබිය යුතු ප්‍රෝටීන ප්‍රතිශතය වැඩි ය.
    (3) සතුන්ට ආහාර කැට ලෙස ලබා දීමට වඩා කුඩු ලෙස ලබා දීම සුදුසු ය.
    (4) ඝන ආස්තරණ ක්‍රමයට සාපේක්ෂව තට්ටු ක්‍රමයට ඇති කිරීමේ දී සතුන්ගේ නිෂ්පාදනය ඉහළ මට්ටමක පවතී.
    (5) පළමු දිනයේ සිට සති දෙකක් දක්වා ආරම්භක සලාකය ද, සති දෙකකට පසු අවසන් ආහාර සලාකය ද සැපයිය යුතු ය.

38. ශ්‍රී ලංකාවේ වියළි කලාපය සඳහා දෙමුහුන් අභිජනනයට නිර්දේශිත ගව වර්ග වනුයේ,
    (1) ජර්සි, සාහිවාල් සහ ෆ්‍රිෂියන් ය.
    (2) ජර්සි, සහිවාල් සහ සින්දි ය.
    (3) සහිවාල්, සින්දි සහ ෆ්‍රිෂියන් ය.
    (4) ජර්සි, සින්දි සහ අයර්ෂයර් ය.
    (5) ජර්සි, ෆ්‍රිෂියන් සහ අයර්ෂයර් ය.

39. කිලෝග්‍රෑම් 500ක් බරැති එළදෙනකට දිනකට අවශ්‍ය නැවුම් තණකොළ ප්‍රමාණය දළ වශයෙන් කිලෝග්‍රෑම්,
    (1) 10 කි. (2) 20 කි. (3) 30 කි.
    (4) 40 කි. (5) 50 කි.

40. ඛෲඩරය තුළ කුකුළු පැටවුන් පාලනය කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඛෲඩරයට පැටවුන් ඇතුළු කර පළමු පැය 24 තුළ ආහාර ලබා නොදේ.

B - ඛෲඩරයට පැටවුන් ඇතුළු කර පැය 24 කට පසුව උෂ්ණත්වය ලබා දීම ආරම්භ කළ යුතුය.

C - බිත්තර දමන ආකාරයේ කුකුළු පැටවුන් සති 6-8 ක කාලයක් ඛෲඩරය තුළ නඩත්තු කළ යුතුය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

41. ගව දෙනුන් කෘත්‍රිමව සිංචනය කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දෙනගේ ග්‍රීවය තුළ ශුක්‍රාණු තැන්පත් කිරීමට කෘත්‍රිම යෝනියක් භාවිත කරයි.

B - ශුක්‍රාණු, ද්‍රව නයිට්‍රජන් භාවිත කර -196 $^0$C උෂ්ණත්වයක පවත්වා ගනිමින් සංරක්ෂණය කරයි.

C - දෙනක් කෘත්‍රිමව සිංචනය කිරීමට සුදුසුම අවස්ථාව මදය ආරම්භ වී පැය 12 -18 අතර දී ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

42. ආහාර නිෂ්පාදනය සෞඛ්‍යාරක්ෂිත හා උසස් තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා නිෂ්පාදනාගාරය තුළ නියමිත තත්ත්ව පවත්වා ගන්නා බව සහතික කරනු ලබන ප්‍රමිති සහතිකය වනුයේ,

(1) HACCP ය. (2) GMP ය.
(3) ISO ය. (4) GAP ය.
(5) SLS ය.

43. කැල්සියම් කාබයිඩ් සෘජුව යෙදීමෙන් පලතුරු ඉදවීම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කැල්සියම් කාබයිඩ්වලින් නිකුත් කරන මීතේන් වායුව මගින් පලතුරු ඉදීම සිදු වේ.
(2) වෙළෙඳපොළේ ඇති කැල්සියම් කාබයිඩ්වල අඩංගු ආසනික් වැනි බැර ලෝහ ආහාර සමඟ ශරීරගත වීමෙන් මානව සෞඛ්‍යයට හානි සිදු වේ.
(3) කැල්සියම් කාබයිඩ් මගින් පලතුරු ඉදවීමේ දී පලතුර ඒකාකාරීව කහ පැහැ නොවේ.
(4) කැල්සියම් කාබයිඩ්වලින් නිකුත් වන එතිලීන් හෝර්මෝනය මගින් ස්වාභාවිකව පලතුරු ඉදීම සිදු වේ.
(5) කැල්සියම් කාබයිඩ් යොදා ඉදවීම මගින් ආහාරයේ රසය සහ සුවඳ වැඩි දියුණු වන නිසා පලතුරුවල ගුණාත්මකබව වැඩිවේ.

44. කෘෂි වන වගාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - බෝග මෙන්ම සත්ත්ව පාලනය ද ධනාත්මක අන්තර්ක්‍රියා ඇතිවන ලෙස කළමනාකරණය කරයි.

B - උඩරට ගෙවතු වගාව සම්ප්‍රදායික කෘෂි වන වගා පද්ධතියකි.

C - අවුරුදු කිහිපයක් අත්හැර දැමූ හේනක් විවිධ ශාක ඇතිවීමෙන් පසුව කෘෂි වන වගා පද්ධතියක් බවට පත්වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.


45. අගය දාම විශ්ලේෂණයේ දී,

(1) නිෂ්පාදන පිරිවැය වැඩිවන අතර නිෂ්පාදන ධාරිතාව අඩු වේ.
(2) භාණ්ඩ සඳහා වැඩි මිලක් ගෙවීමට සිදුවන බැවින් පාරිභෝගිකයා ප්‍රතිලාභ නොලබයි.
(3) අගය දාමයට සම්බන්ධ සියලු දෙනා අතර ආදායම බෙදී යයි.
(4) කාර්යක්ෂමතාවය වැඩි ස්ථාන සඳහා අඩු මිලක් නියම වේ.
(5) අගය එකතු කළ නිෂ්පාදන බෙදාහැරීමේ වියදම වැඩි වේ.

46. ඒකාධිකාරී තරග වෙළෙඳපොළක දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

(1) නිෂ්පාදකයා විසින් වෙළෙඳපොළ මිල විශාල වශයෙන් පාලනය කිරීම ය.
(2) වෙළෙඳ ආයතන කුඩා සංඛ්‍යාවක් පැවතීම ය.
(3) ඇතුළු වීමට හා පිටවීමට ප්‍රබල බාධක තිබීම ය.
(4) නිපැයුම් බොහෝ දුරට සර්වසම වීම ය.
(5) අධි ප්‍රාමාණික ලාභ අඛණ්ඩ ව පැවතීම ය.

- ඉල්ලුම් වක්‍ර විතැන් වීම දැක්වෙන ප්‍රස්තාරයක් පහත දක්වා ඇත. ප්‍රශ්න අංක 47 ට පිළිතුරු සැපයීමට එම ප්‍රස්තාරය භාවිත කරන්න.





47. ඉහත ප්‍රස්තාරයේ පරිදි ඉල්ලුම් වක්‍රය විතැන් වනුයේ,
    (1) ආදේශක භාණ්ඩවල මිල අඩු වීම නිසා ය.
    (2) අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම නිසා ය.
    (3) පාරිභෝගිකයාගේ ආදායම අඩු වීම නිසා ය.
    (4) පාරිභෝගිකයාගේ රුචිය අඩු වීම නිසා ය.
    (5) අනාගතයේ දී භාණ්ඩයෙහි මිල අඩු වේ යැයි අපේක්ෂා කිරීම නිසා ය.

48. කෘෂි ව්‍යාපාරයක ව්‍යාපාර පරිසරය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A - කෘෂි ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය සමන්විත වන්නේ මෙහෙයවන්නන්, සේවකයන්, පාරිභෝගිකයන් හා සැලසුම්කරුවන් ගෙනි.
    B - ව්‍යාපාරයක, ආර්ථික පරිසරය හා තාක්ෂණික පරිසරය බාහිර පරිසරයට අයත් කොටස් වේ.
    C - රටේ සමස්ත ජනගහනයේම අවශ්‍යතා සපුරාලන පරිදි ව්‍යාපාර සැලසුම් කිරීමට ප්‍රජා පරිසරය වැදගත් වේ.

    ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
    (1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
    (4) A සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම ය.

- නිෂ්පාදන ක්‍රියාවලියක යෙදවුම් - යෙදවුම් අතර සම්බන්ධතාවය නිරූපණය වන ප්‍රස්තාරයක් පහත දැක්වේ. ප්‍රශ්න අංක 49 ට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය භාවිත කරන්න.




49. ඉහත ප්‍රස්තාරයේ දැක්වෙන P සහ Q වක්‍ර පිළිවෙලින්,
    (1) සම පිරිවැය වක්‍ර සහ සම නිෂ්පාදන වක්‍ර වේ.
    (2) සම නිෂ්පාදන වක්‍ර සහ සම පිරිවැය වක්‍ර වේ.
    (3) නිෂ්පාදන හැකියා වක්‍ර සහ සම ආදායම් වක්‍ර වේ.
    (4) සම නිෂ්පාදන වක්‍ර සහ සම ආදායම් වක්‍ර වේ.
    (5) සම ආදායම් වක්‍ර සහ නිෂ්පාදන හැකියා වක්‍ර වේ.

50. වගා ක්ෂේත්‍රය තුළ හෝ වගා ක්ෂේත්‍ර අතර විචලතාව නිරීක්ෂණය කර එම තත්ත්වවලට තොරතුරු තාක්ෂණය උපයෝගී කර ප්‍රතිචාර දැක්වීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම මගින් සිදු කරන ගොවිපොළ කළමනාකරණය වනුයේ,
    (1) කාබනික කෘෂිකර්මාන්තය ය.
    (2) යථා තත්‍ය කෘෂිකර්මාන්තය ය.
    (3) සංරක්ෂණ කෘෂිකර්මාන්තය ය.
    (4) වර්ෂාපෝෂිත කෘෂිකර්මාන්තය ය.
    (5) තිරසර කෘෂිකර්මාන්තය ය.

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026

| කෘෂි විද්‍යාව II | 08 | S | II | පැය තුනයි |
|---|---|---|---|---|

විභාග අංකය : ..............................

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු **12** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය පැය තුනකි.

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 02 - 11)**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මෙම ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු අංක 12)**

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

---

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංක


| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය | |

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න**

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (A) සෞම්‍ය දේශගුණයක් සහිත ප්‍රදේශයක සිදුවන කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියක, කාලය සමඟ උෂ්ණත්වය වෙනස්වීම පහත ප්‍රස්තාරයෙන් දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට එම ප්‍රස්තාරය යොදා ගන්න.




(i) ඉහත රූප සටහනේ A සහ B ලෙස නම් කර ඇති කොම්පෝස්ට් සෑදීමේ ප්‍රධාන අවධි දෙක නම් කරන්න.

(1) A ..............................................................................................

(2) B ..............................................................................................

(ii) ඉහත A අවධියේ දී මිය යන රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් දෙදෙනෙකු නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(iii) කොම්පෝස්ට් ගොඩෙහි ඔක්සිජන් ප්‍රතිපූර්ණය කිරීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාකාරකම සඳහන් කරන්න.

..............................................................................................

(iv) අපරිණත කොම්පෝස්ට්වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(B) ශාක වර්ධනයට අවශ්‍ය වන ශාක පෝෂක කිහිපයක් පහත දැක් වේ. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| C | N | Si | Ca | O | Fe |
|---|---|---|---|---|---|

(i) ඉහත පෝෂක අතුරෙන් උපකාරක මූලද්‍රව්‍යයක් නම් කරන්න.

..............................................................................................

(ii) මෙම පෝෂක අතුරෙන් පසෙන් පමණක් ලබා ගන්නා මූලද්‍රව්‍ය **තුනක්** ලැයිස්තුගත කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(iii) ඉහත සඳහන් පෝෂකයක ඌනතාවක් නිසා ශාකයක ළපටි පත්‍ර කහ පැහැයට හැරී ඇති බව නිරීක්ෂණය විය. එම පෝෂකය කුමක්ද?

..............................................................................................

(C) පසක ඇති අතිරික්ත ජලය පාංශු පැතිකඩ හරහා ස්වභාවිකව ඉවත්ව යාම ජලවහනය යි.

(i) පසක ජල වහනය දියුණු කිරීමට යොදා ගත හැකි උප පෘෂ්ඨීය ක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ..........


(2) ..........

(ii) පසක ජල වහනය දුර්වල වීමට ප්‍රධාන හේතු **දෙකක්** ලියන්න.

(1) ..........

(2) ..........


(iii) පහත A සහ B ලෙස නම් කර ඇති රූපසටහන්වල දක්වා ඇති ජලවහන කාණු පද්ධති ආකාර නම් කරන්න.




(1) A ..........

(2) B ..........

(D) ශාක කායික ක්‍රියාවලියක් පරීක්ෂා කිරීමට සකසන ලද ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම රූපසටහන යොදා ගන්න.




(i) ඉහත ඇටවුම මගින් පරීක්ෂා කරන්නේ කුමක්ද?

..........

(ii) මෙම ඇටවුමේ A ලෙස ලේබල් කර ඇති උපකරණය සඳහන් කරන්න.

..........

(iii) ඇටවුම සකසා පැය කිහිපයකට පසු සිදු කළ හැකි නිරීක්ෂණයක් සඳහන් කරන්න.

..........

(iv) ඉහත (i) පිළිතුර බෝග වර්ධනය කෙරෙහි වැදගත්වන ආකාරය සඳහන් කරන්න.

..........

(E) බීජ ප්‍රරෝහණය හා ඉන්පසු මනා බෝග වර්ධනයක් ලබා ගැනීම සඳහා පස භෞතිකව සකස් කිරීම බිම් සැකසීම ලෙස හැඳින්වේ.

(i) බිම් සැකසීමේ දී පසෙහි සිදුවන භෞතික වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(ii) බිම් සැකසීමේ ප්‍රධාන අදියර දෙක සඳහන් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(iii) ඇටවරා (*Cynodon dactylon*) වල්පැළෑටිය බහුලව දක්නට ලැබෙන වගා භූමියක් සඳහා වඩාත් උචිත ප්‍රාථමික බිම් සැකසීමේ ආකාරය සඳහන් කරන්න.

..................................................

(F) කෘෂිකර්මාන්තයේ නියැළීමේ දී කෘෂි දේශගුණික සාධක පිළිබඳ දැනුම වැදගත් වේ.

(i) කාලගුණ මධ්‍යස්ථානයක දිනකට වරක් හා දෙවරක් ලබා ගන්නා කාලගුණ පරාමිති දෙක බැගින් සඳහන් කරන්න.

| | දිනකට වරක් ලබා ගන්නා කාලගුණ පරාමිති | දිනකට දෙවරක් ලබා ගන්නා කාලගුණ පරාමිති |
|---|---|---|
| (1) | ............................ | ............................ |
| (2) | ............................ | ............................ |

(ii) දී ඇති පද අතුරෙන් වඩාත් සුදුසු පදය තෝරා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාවට මෝසම් වැසි ඇතිවීමට අන්තර් නිවර්තන අභිසාරී කලාපයෙහි විස්ථාපනය හේතු වේ. අන්තර් නිවර්තන අභිසාරී කලාපය ශ්‍රී ලංකාවෙන් (1) ............................ (උතුරු/දකුණු) දෙසට විස්ථාපනය වීම, නිරිත දිග මෝසම් වැසි ඇතිවීමට හේතු වන අතර එය ශ්‍රී ලංකාවෙන් (2) ............................ (උතුරු/දකුණු) දෙසට විස්ථාපනය වීම, ඊසාන දිග මෝසම් වැසි ඇතිවීමට හේතුවේ. නිරිත දිග මෝසම් වැසි (3) ............................ (මැයි/දෙසැම්බර්) සිට (4) ............................(සැප්තැම්බර්/පෙබරවාරි) දක්වා පවතින අතර එමගින් වගා කරනු ලබන කන්නය, (5) ............................ (යල/මහ) කන්නය යි.

2. (A) ශාකයක ඕනෑ ම සජීවී කොටසක් ජීවාණුහරිත කෘත්‍රිම රෝපණ මාධ්‍යයක් තුළ පාලිත පාරිසරික තත්ත්ව යටතේ රෝපණය කර එමගින් පැළ ලබා ගැනීම පටක රෝපණය ලෙස හැඳින්වේ.

(i) පටක රෝපණ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා මූලධර්මය සඳහන් කරන්න.

..................................................

(ii) පටක රෝපණයේ දී බහුලව භාවිත වන පෝෂක මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(iii) පටක රෝපණ ක්‍රියාවලියේ දී රෝපණ මාධ්‍යය ජීවාණුහරණයට යොදා ගන්නා භෞතික ජීවාණුහරණ ක්‍රමය සඳහන් කරන්න.

..................................................

(iv) පටක රෝපණ විද්‍යාගාරයක, රෝපණ මාධ්‍යය පිළියෙළ කර ගන්නා කාමරයක තිබිය යුතු උපකරණ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(B) බීජ සෞඛ්‍යය යනු බීජවල ගුණාත්මකභාවය තීරණය කරන ප්‍රධාන සාධකයකි.

(i) බීජ සෞඛ්‍යයට බලපාන ජෛව සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) බීජ සෞඛ්‍යයට බලපාන අජෛව සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(iii) බීජ සෞඛ්‍ය පරීක්ෂා කිරීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................


(2) ..........................................................................................

(iv) බීජ ගබඩා කිරීමේ දී, බීජ සෞඛ්‍යය රැකගැනීම සඳහා පාලනය කළ යුතු ප්‍රධාන පාරිසරික සාධක **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(C) කෘමීන්ගේ භෝජන විලාසය අනුව දර්ශීය මුඛ උපාංග විවිධ විකරණයන්ට ලක්වී ඇත. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත රූපසටහන භාවිත කරන්න.




(i) ඉහත රූපසටහනේ දක්වා ඇති මුඛ උපාංග ආකාරය සඳහන් කරන්න.

..........................................................................................

(ii) මෙහි තුණ්ඩය කොටස සෑදී ඇත්තේ දර්ශීය මුඛ උපාංගයේ කුමන කොටස විකරණය වීමෙන්ද?

..........................................................................................

(iii) මෙම මුඛ උපාංග ආකාරය සහිත කෘමි පළිබෝධකයෙකුගේ පූර්ව පියාපතේ අවිදුර තුනෙන් දෙකක කොටස ඝනවී ඇති බව නිරීක්ෂණය විය. එම කෘමි පළිබෝධකයා අයත් විය හැකි කෘමි ගෝත්‍රය සඳහන් කරන්න.

..........................................................................................

(iv) ඉහත (iii) පිළිතුරෙහි සඳහන් කෘමි ගෝත්‍රයට අයත් වන පළිබෝධ සඳහා උදාහරණ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(D) ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමනාකරණයේ දී යොදා ගන්නා ජීවීන් ජෛව පාලක ලෙස හැඳින්වේ.

(i) ජෛව පාලකයෙකු තේරීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(ii) ජෛව පාලක ලෙස යොදා ගන්නා ජීවීන් කාණ්ඩ **තුන** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(E) (i) පොලිතීන් උමං තුළ බෝග වගාවේ දී ගොවීන් මුහුණ දෙන පහත සඳහන් ගැටලු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් නම් කරන්න.

(1) පොලිතීන් ආවරණය මත ඇල්ගී වර්ධනය වීම

..............................

(2) පොලිතීන් උමඟ තුළ උෂ්ණත්වය අධික ලෙස ඉහළ යාම

..............................

(3) පොලිතීන් උමඟ තුළ සාපේක්ෂ ආර්ද්‍රතාවය අධික ලෙස ඉහළ යාම

..............................

(4) බෝගවල පරාගනයට බාධා ඇතිවීම

..............................

(5) වගාව තුළ පළිබෝධ ව්‍යාප්ත වීම

..............................

3. (A) බෝගවල පසු අස්වනු හානි අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

(i) පහත අවස්ථාවල දී පසු අස්වනු හානිය අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න.

(1) ගබඩා තත්ත්වවල දී අර්තාපල් ආකන්ද කොළ පැහැති වීම.

..............................


(2) අඹ අස්වනු නෙලූ පසු ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇති වීම.

..............................

(3) අස්වනු නෙලූ පසු කොළ එළවලු මැලවීම.

..............................

(ii) බෝග අස්වනුවල පරිණත දර්ශක මැනීම සඳහා යොදා ගන්නා උපකරණ දෙකක් පහත රූපසටහන්වල දැක්වේ. ප්‍රශ්න අංක (1) සහ (2) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම රූපසටහන් යොදා ගන්න.




(1) A සහ B උපකරණ නම් කරන්න.

a) A ....................................................................................................


b) B ....................................................................................................

(2) ඉහත එක් එක් උපකරණය මගින් මනිනු ලබන පරිණත දර්ශකය සඳහන් කරන්න.

a) A ....................................................................................................

b) B ....................................................................................................

(B) එළදෙනකගේ මද චක්‍රය පාලනය කෙරෙහි හෝර්මෝනවල බලපෑම පහත ප්‍රස්තාරය මගින් නිරූපණය වේ. ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම ප්‍රස්තාරය යොදා ගන්න.




(i) ඉහත ප්‍රස්තාරයේ P සහ Q ලෙස නම් කර ඇති හෝර්මෝන නම් කරන්න.

(1) P ....................................................................................................

(2) Q ....................................................................................................

(ii) Q හෝර්මෝනයේ කාර්යය සඳහන් කරන්න.

....................................................................................................

(iii) මෙහි S සිට T දක්වා කාලය කොපමණද?

....................................................................................................

(C) ගොවිපොළ සත්ත්ව ආහාර, ඒවායේ අඩංගු දළ තන්තු ප්‍රමාණය අනුව වර්ගීකරණය කරයි.

(i) පහත ලැයිස්තුගත කර ඇති කාණ්ඩවලට අයත් සත්ත්ව ආහාර සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.

| සත්ත්ව ආහාර කාණ්ඩය | උදාහරණය |
|---|---|
| (1) සත්ත්වමය සම්භවයක් සහිත ප්‍රෝටීන පරිපූරක | ................................................................ |
| (2) කාබෝහයිඩ්‍රේට පරිපූරක | ................................................................ |
| (3) ගෝචර තෘණ | ................................................................ |
| (4) තෘණ සංරක්ෂණය කර නිපදවූ තෙත් දළ ආහාර | ................................................................ |

(ii) කුකුළාගේ ආහාර ජීර්ණ පද්ධතිය තුළ සිදුවන ආහාර ජීර්ණ ක්‍රියාවලි කිහිපයක් පහත දැක්වේ. එම ක්‍රියාවලි සඳහා දායක වන A, B සහ C ලෙස ලේබල් කර ඇති එන්සයිම නම් කරන්න.

කාබෝහයිඩ්‍රේට $\xrightarrow{A}$ මොල්ටෝස් + ග්ලූකෝස්

ප්‍රෝටීන $\xrightarrow{B}$ ඇමයිනෝ අම්ල


මේදය $\xrightarrow{C}$ මේද අම්ල + ග්ලිසරෝල්

(1) A ..............................................................................................................

(2) B ..............................................................................................................

(3) C ..............................................................................................................

(D) එළදෙනකගේ ක්ෂිරණ පද්ධතියේ අභ්‍යන්තර ව්‍යුහය පහත රූපසටහන මගින් දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම රූපසටහන යොදා ගන්න.




(i) මෙම රූප සටහනෙහි P, Q, R සහ S ලෙස ලේබල් කර ඇති කොටස් නම් කරන්න.

(1) P ..............................................................................................................

(2) Q ..............................................................................................................

(3) R ..............................................................................................................

(4) S ..............................................................................................................

(ii) එළදෙනකගේ ක්ෂිරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වයට බලපාන පහත ක්‍රියාවලි සඳහා වැදගත්වන හෝර්මෝනය බැගින් නම් කරන්න.

(1) කිරි ස්‍රාවය වීම ................................................................

(2) කිරි එරීම ................................................................

(iii) කිරි දෙවීම ආරම්භ කිරීමට ප්‍රථමව ස්ට්‍රිප් කප් (strip cup) පරීක්ෂාව සිදු කිරීමේ අරමුණ සඳහන් කරන්න.

.......................................................................................................................................

(E) රෝග ඇතිවීම නිසා ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනය අඩුවන බැවින් රෝග පාලනය වැදගත් වේ.

(i) ගවයින්ට වැළඳෙන පහත රෝග ඇතිකරන රෝගකාරක ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය නම් කරන්න.

(1) කුර හා මුඛ රෝගය .......................................................................................................

(2) කිණිතුළු උණ ...........................................................................................................

(ii) පහත රෝග වළක්වා ගැනීමට බ්‍රොයිලර් කුකුළන්ට එන්නත් ලබාදිය යුතු වයස සඳහන් කරන්න.

(1) මරෙක්ස් ....................................................................................................................

(2) රානිකට් ....................................................................................................................

(F) ආපදාවක් යනු පුද්ගලයෙකුට උපද්‍රවයක් ඇති කිරීමට විභවතාවක් ඇති ඕනෑම දෙයකි.

(i) අධික කම්පන සහිත යන්ත්‍ර සූත්‍ර සමඟ දීර්ඝකාලීනව කටයුතු කරන පුද්ගලයෙකුගේ සෞඛ්‍යයට ඇති විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(ii) කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍රවල අධික ශබ්දය හා කම්පන අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

4. (A) කෘෂිකාර්මික කටයුතුවල දී අවශ්‍ය සේවා සැපයීම සඳහා රාජ්‍ය ආයතන විශාල කාර්යභාරයක් ඉටු කරයි.

(i) පහත දක්වා ඇති සේවාව සැපයීම සඳහා වගකීම දරන රාජ්‍ය ආයතනය නම් කරන්න.

| සේවාව | වගකීම දරන රාජ්‍ය ආයතනය |
|---|---|
| (1) ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම | ........................................ |
| (2) පොහොරවල ගුණාත්මකභාවය තහවුරු කිරීම | ........................................ |

(ii) 2025 වසරේ අගභාගයේ දී ඇති වූ දේශගුණික ව්‍යසනකාරී තත්ත්වය නිසා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සෘජුව බලපෑම් එල්ල විය. එම බලපෑම් වලින් සිදු වූ හානිය අවම කිරීමට ශ්‍රී ලංකා රජය ගත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(B) ආහාරයක් පරිභෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වීම ආහාර නරක් වීම ලෙස හඳුන්වන අතර ආහාර නරක් වීමට බලපාන සාධක පාලනය කිරීමෙන් ආහාරයේ ගුණාත්මකබව සහ ජීව කාලය වැඩි කළ හැකිය.

(i) නරක් වූ ආහාර හඳුනාගත හැකි ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(ii) ආහාර නරක් වීම සඳහා බලපාන භෞතික සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(iii) ආහාර නරක්වීම සිදුවන පහත අවස්ථා සඳහා ප්‍රධාන හේතුව සහ එය වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න.

| ආහාර නරක් වන අවස්ථාව | හේතුව | වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ගය |
|---|---|---|
| (1) කපන ලද අර්තාපල් කැබලි මතුපිට දුඹුරු පැහැ වීම | .............................................. | .............................................. |
| (2) මී කිරි ඇඹුල් රස වීම | .............................................. | .............................................. |

(C) ජාන කිටුවක ඇති ජාන වඳ වීමට ලක් වුවහොත් ඒවා නැවත කෘත්‍රිම ව ඇති කළ නොහැකි ය. එම නිසා සියලුම ජාන සම්පතක් ලෙස රැක ගැනීම වැදගත් වේ.

(i) ජාන සම්පත් විනාශ වීමට ප්‍රධාන වශයෙන් බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) ජාන සම්පත් සංරක්ෂණය කිරීමට භාවිත කරන ප්‍රධාන ක්‍රම දෙක සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(D) පාංශු ඛාදනය මගින් සිදුවන පස් අංශු වෙන් වීම හා ප්‍රවාහනය වීම ස්වාභාවික හෝ කෘත්‍රිම ක්‍රම යොදා අවම කිරීමෙන්, උපරිම ඵලදායිතාවක් ලැබෙන සේ පස නිවැරදිව හා තිරසරව භාවිත කිරීම පාංශු සංරක්ෂණය යි.

(i) වර්ෂා ජලය මගින් සිදුවන පාංශු ඛාදන ආකාර **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) පාංශු සංරක්ෂණයේ ප්‍රධාන මූලධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(iii) අධික බෑවුම් සහිත භූමි සංරක්ෂණය සඳහා භාවිත කළ හැකි යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................


(2) ..........................................................................................................

(iv) ජෛව විද්‍යාත්මක පාංශු සංරක්ෂණයේ දී බහුලව යොදා ගන්නා ආවරණ බෝගයක් සඳහා උදාහරණයක් සඳහන් කරන්න.

..........................................................................................................

(E) ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය යන දෙක ම වෙනස් වීම නිසා වෙළෙඳපොළ සමතුලිතතාව වෙනස් විය හැකි ආකාර තුන පහත දැක්වේ.

A - ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය සමාන ලෙස විතැන් වීම
B - ඉල්ලුම් වක්‍රයට වඩා වේගයෙන් සැපයුම් වක්‍රය විතැන් වීම
C - සැපයුම් වක්‍රයට වඩා වේගයෙන් ඉල්ලුම් වක්‍රය විතැන් වීම




(i) මෙම ප්‍රස්තාරය මගින් නිරූපණය වන්නේ ඉහත සඳහන් ආකාර අතුරෙන් කුමන ආකාරය ද?

.............................................................................................................

(ii) ඉහත (i) පිළිතුරෙහි සඳහන් ආකාරයට කෘෂි භාණ්ඩවල ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර විතැන් වීමට හේතුව සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

(iii) සමතුලිත වෙළෙඳපොළක ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

(1) .............................................................................................................
(2) .............................................................................................................
(3) .............................................................................................................

(F) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක නිෂ්පාදන කලාප පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මෙම ප්‍රකාශවල වැරදි/නිවැරදි බව සඳහන් කරන්න.

| ප්‍රකාශය | වැරදි/නිවැරදි බව |
|---|---|
| (i) පළමු නිෂ්පාදන කලාපය තුළදීම හීන වන ඵල ලැබීම ආරම්භ වේ. | |
| (ii) දෙවන නිෂ්පාදන අවධියේ දී මුළු නිෂ්පාදනය උපරිම වන අවස්ථාවේ ආන්තික නිෂ්පාදනය ශුන්‍ය වේ. | |
| (iii) විචල්‍ය සාධක ප්‍රමාණය ස්ථාවර සාධකයට මනාව ගැළපී ඉහළම ලාභදායී මට්ටමට නිමැවුම් ලැබෙන්නේ තුන්වන නිෂ්පාදන අවධිය තුළය. | |

(G) තිරසර කෘෂිකර්මාන්තය යනු කෘෂිකාර්මික පරිසර පද්ධතියක සෞඛ්‍යය, ජෛව විවිධත්වය, ජෛවීය චක්‍ර හා ක්‍රියාවලි ප්‍රවර්ධනය කරමින් සිදුකරන කළමනාකරණ පද්ධතියකි.

(i) තිරසර කෘෂිකර්මාන්තයට පාදක වන පාරිසරික මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

(1) .............................................................................................................
(2) .............................................................................................................

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026

කෘෂි විද්‍යාව II | 08 | S | II

**B කොටස - රචනා**

**උපදෙස් :**

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූපසටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

5. (i) ශ්‍රී ලංකාවේ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ අරමුණු හා පරමාර්ථ විස්තර කරන්න.
   (ii) ආහාර අසුරුම්කරණයේ වැදගත්කම විස්තර කරන්න.
   (iii) ආම්ලික පසක බෝග වගා කිරීමේ දී ඇති වන ගැටලු විස්තර කරන්න.

6. (i) බෝග වගාවේ දී ජෛව පොහොර භාවිත කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
   (ii) කෘෂිකාර්මික බෝග නිෂ්පාදනවල පසු අස්වනු හානිය කෙරෙහි බලපාන පෙර අස්වනු සාධක විස්තර කරන්න.
   (iii) කෘෂි ව්‍යාපාර සැලැස්මක අංග විස්තර කරන්න.

7. (i) ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටි තම පැවැත්ම සඳහා දක්වන අනුවර්තන විස්තර කරන්න.
   (ii) කෘෂිකර්මාන්තයේ දී ශාකවල ශ්වසන ක්‍රියාවලිය යාමනය කිරීමේ අවශ්‍යතාව විස්තර කරන්න.
   (iii) බෝග ක්ෂේත්‍රවලට ජල සම්පාදනයේ දී බිංදු ජල සම්පාදන ක්‍රමය යොදා ගැනීමේ වාසි සහ අවාසි විස්තර කරන්න.

8. (i) ඒකාකාර වගාවක් ලබා ගැනීම සඳහා බීජවල සුප්තතාව ඉවත් කිරීමට යොදා ගත හැකි ක්‍රම විස්තර කරන්න.
   (ii) ඉහළ බිත්තර නිෂ්පාදනයක් සහිත කිකිළියන් සහ අඩු බිත්තර නිෂ්පාදනයක් සහිත කිකිළියන් වෙන් කර හඳුනාගැනීම සඳහා යොදා ගත හැකි ලක්ෂණ විස්තර කරන්න.
   (iii) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණය මගින් අත්වන ප්‍රතිලාභ විස්තර කරන්න.

9. (i) පාංශු ජනනය සඳහා බලපාන සාධක විස්තර කරන්න.
   (ii) නිවැරදි ව සහ ක්‍රමවත් ව වසු පැටවුන් පාලනය කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
   (iii) පැළ තවාන් සැකසීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න.

10 (i) කෘෂි නිෂ්පාදන අලෙවිකරණයේ කාර්යක්ෂමතාව වැඩි කළ හැකි ආකාරය විස්තර කරන්න.
   (ii) මිශ්‍ර බෝග වගාවේ වාසි සහ අවාසි විස්තර කරන්න.
   (iii) නිර්පාංශු වගාව සඳහා භාවිත කරන ඝන මාධ්‍යයක තිබිය යුතු ගුණාංග විස්තර කරන්න.